# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

**නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.**
**சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.**
**Independence Square, Colombo 07, Sri Lanka.**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/Vacancies - Reply (Vol. I) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.04.29 |

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන නිවේදනයයි.

**<u>තාක්ෂණ අමාත්‍යාංශය</u>**

**<u>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ (පාලන) තනතුරට පත් කිරීම</u>**

තාක්ෂණ අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පුරප්පාඩුව පවතින පහත තනතුර සඳහා ද්විතීයන පදනම මත අනුයුක්ත වීමට මනාපය පළ කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **තනතුර** | **:** | **අධ්‍යක්ෂ (පාලන)** |
| **වැටුප් කේතය** | **:** | **HM 1-3** |
| **වැටුප් කාණ්ඩය** | **:** | **86,865 – 15 x2,270 -120,915 /=** |

02. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ (පාලන) තනතුරු සඳහා අනුයුක්ත වීමට මනාපය පළ කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ අයදුම්කරුවන් විසින් ස්වකීය තොරතුරු ඇතුළත් ජීව දත්ත පත්‍රිකාව 2024.05. 15 දින හෝ එම දිනට ප්‍රථම තම ආයතන ප්‍රධානියා මගින් ලේකම්, තාක්ෂණ අමාත්‍යාංශය, ඒකකය 1101, 11 වන මහළ, වන් ගෝල්ෆේස් කුළුණ, අංක 1 ඒ, මැද පාර, කොළඹ 02 ලිපිනය වෙත ලියාපදිංචි තැපෑල ඔස්සේ එවිය යුතු අතර කවරයේ ඉහළ වම්පස කෙළවරේ තනතුර පැහැදිළිව සඳහන් කර යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. තව ද, අයදුම්පත් යොමු කිරීමේදී, අයදුම්කරුවන් මෙම තනතුර සඳහා සුදුසුකම් ලදහොත් දැනට සේවයේ නියුතු සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව/ පසුව ලබා දීමේ පදනම මත මුදා හැරිය හැකි බවට ස්වකීය අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර අයදුම්පත ඉදිරිපත් කළ යුතු වන අතර අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාර නොගන්නා බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

04. වැඩිදුර තොරතුරු සඳහා අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (දු.ක. 0112671567 / 72 දිගුව : 211), සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව දන්වමි.

පී.ඩබ්ලිව්. රාජපක්ෂ
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

| | | |
|---|---|---|
| දුරකථන | : | 0112-698605 |
| ෆැක්ස් | : | 0112-683651 |
| විද්‍යුත් ලිපිනය | : | pubad.dslas@gmail.com |